# රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

## Ministry of Public Administration, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| | | | |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2695279 |
| ඊ-මේල් / மின்னஞ்சல் / E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Telephone | www.pubad.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | 76/1/15/18 (I) XX වෙළුම | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2026.04.10 |

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

කොමිෂන් සභා ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම</u>

අංක 1842/2 හා 2013.12.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2137/5 හා 2019.08.19 දිනැතිව කරන ලද හයවන සංශෝධනය හා 2019.10.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2019 හි විධිවිධාන පරිදි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2025.12.19 දිනැති අංක 2467/69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීමට අනුව, 2013.12.28 දිනට පත්වීම පෙරදාතම් කරන ලද 2014.04.21 දිනැතිව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවාගෙන ඇති හා 2014.06.02 දිනැතිව එම ශ්‍රේණියට බඳවාගෙන ඇති නිලධාරීන්, I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් හා උසස් කිරීමේ ක්‍රමය**

පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද II ශ්‍රේණියේ නිලධරයන් I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයකින් පිරිනමනු ලබන රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සංවර්ධන ආර්ථික විද්‍යාව, සමාජ සංවර්ධනය, නීතිය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති සැළසුම්කරණය හා කළමනාකරණය, තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට පැවරෙන බහුවිධ කළමනාකරණ කාර්ය භාරය ඉටු කිරීම පිණිස අවශ්‍ය දැනුම හා කුසලතාවය ලබා ගැනීම සඳහා යෝග්‍ය යැයි ශ්‍රී ලංකා පරිපාලන සේවා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් විෂය ක්ෂේත්‍රයන් අතුරින් හෝ අවම වශයෙන් එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

V. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන මට්ටම III පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවම් ලබා නොතිබීම.

03. ඉහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මේ සමග වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් පහත දිනට පෙර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.), ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය

| පත්වීම් දිනය | අයදුම්පත් යොමු කළ යුතු දිනය |
|---|---|
| 2014.04.21 (2013.12.28 දිනට පත්වීම පෙරදාතම් කරන ලද ) | 2026.05.25 දිනට පෙර |
| 2014.06.02 | 2026.07.06 දිනට පෙර |

**(සැ.යු. : දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු නිලධරයන් ස්වදේශ කටයුතු අංශය මඟින් අයදුම්පත් යොමු කිරීමට කටයුතු කළ යුතුය.)**

04. උසස් කිරීම සඳහා අදාළ ඉල්ලුම්පත "ඇමුණුම 01" මඟින් ඉදිරිපත් කර ඇති අතර එහි මෘදු පිටපත පහත දැක්වෙන පරිදි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

www.pubad.gov.lk → සේවා → ශ්‍රී ලංකා පරිපාලන සේවය → බාගත කිරීම්

එච්.ඒ.ඩී.සී. ජයසේකර
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට
දුරකතන : 011-2698605
ෆැක්ස් : 011-2683651
විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com

# <u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත</u>

**කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි -**

| |
|---|
| S |
| F |

**<u>(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය</u>.**

1. නම

1.1. සම්පූර්ණ නම :- ..................................................................................................................................

..................................................................................................................................මෙය/මයා/මිය

(ජාතික හැඳුනුම්පතෙහි සඳහන් පරිදි)

1.2. පත්වීම් ලිපියෙහි සඳහන් නම :- ..................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(කරුණාකර ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත ඇමුණුම 01 ලෙස දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර ඉදිරිපත් කරන්න)

3. උපන් දිනය :-

| D | D | M | M | Y | Y | Y | Y |
|---|---|---|---|---|---|---|---|

4. පෞද්ගලික ලිපිනය :- ..................................................................................................................................

..................................................................................................................................

5. දුරකථන අංකය :-

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5.1. නිවස :- | | | | | | | | | | |
| 5.2. ජංගම :- | | | | | | | | | | |

6. විද්‍යුත් තැපැල් ලිපිනය :- ..................................................................................................................................

7. තනතුර (දැනට දරන / විශ්‍රාමික නම් විශ්‍රාම ගනු ලැබූ අවස්ථාවේදී දැරූ තනතුර) :- ......................................................

..................................................................................................................................

7.1. විශ්‍රාමික නම් විශ්‍රාම ලැබූ දිනය :- ..................................................................................................................

8. සේවා ස්ථානය පිළිබඳ තොරතුරු

8.1. අමාත්‍යාංශය :- ..................................................................................................................................

..................................................................................................................................

8.2. අංශය :- ..................................................................................................................................

8.3. දෙපාර්තමේන්තුව :- ..................................................................................................................................

8.4. ලිපිනය :- ..................................................................................................................................

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8.5. දුරකථන අංකය :- | | | | | | | | | | |
| 8.6. ෆැක්ස් අංකය :- | | | | | | | | | | |

9. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ

9.1. III ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය :-

| D | D | M | M | Y | Y | Y | Y |
|---|---|---|---|---|---|---|---|

9.2. පෙරදාතම් කිරීමක් සිදු වී ඇත්නනම් :- එම දිනය

| D | D | M | M | Y | Y | Y | Y |
|---|---|---|---|---|---|---|---|

9.3. II ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති දිනය :-

| D | D | M | M | Y | Y | Y | Y |
|---|---|---|---|---|---|---|---|

10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 13.2 (අ) හි අනු අංක i යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීම පිළිබඳ විස්තර

| අනු අංකය | පශ්චාත් උපාධි පාඨමාලාවේ නම | විෂයය ක්ෂේත්‍රය | එම උපාධිය පිරිනමන ලද විශ්ව විද්‍යාලය | එම විශ්වවිද්‍යාලය, විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයක් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබේද යන වග | උපාධිය වලංගු දිනය |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |

(කරුණාකර උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල සටහනෙහි සහතික කළ පිටපත් ඇමුණුම 02, 02(a) ලෙස දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර ඉදිරිපත් කරන්න)

සැ.යු. : මගේ අංක හා 2025.11.17 දිනැතිව මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරන ලද නිවේදනය අනුව යොමු කරන ලද සහතික පත්‍රවලට අදාළ පශ්චාත් උපාධිය උක්ත වගුවෙහි අනු අංක 01 යටතේ සඳහන් කළ යුතුයි.

11. II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී ඇති දිනය :- ............................................................

12. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන මට්ටම - III පාඨමාලාව සම්පූර්ණ කර ඇති දිනය :- ...............................................................

(කරුණාකර ධාරිතා සංවර්ධන මට්ටම - III පාඨමාලාව සම්පූර්ණ කරන ලද බවට වන සහතික පත්‍රයේ සහතික කළ පිටපත ඇමුණුම 03 ලෙස දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර ඉදිරිපත් කරන්න)

උසස් වීමට සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හයකට (06) නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, ඉහත අංක 01 සිට 12 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත ඒ සමග අමුණා එවන ලෙස සඳහන් කර ඇති සියලු ලේඛන වල සහතික කළ පිටපත්, එක් එක් කරුණට අදාළ අංකය එම ලේඛන වල දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර, අංක පිළිවෙලින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර, මේ සමග ඉදිරිපත් කරන බවත් සඳහන් කරමි.

................................................ ................................................

දිනය ඉල්ලුම්කරුගේ අත්සන

තනතුරු නාමය :

නිල මුද්‍රාව :

<u>(ආ) කොටස - දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.</u>

ලේකම්,

.............................................................................................................................................................

......................................................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය

........................................................................................................ දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ

............................................................................................................ ලෙස සේවය කරනු ලබන බවත්,

1. II ශ්‍රේණියේ වසර හයක (06) කාලය තුළ සතුටුදායක සේවයක් සම්පූර්ණ කර **ඇති බවත් / නැති** බවත්,
2. වගු අංක 01හි දැක්වෙන පරිදි, I ශ්‍රේණියට උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 06 ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන **ඇති බවත් / නැති බවත්**,*

2.1. වගු අංක 01

| අනු අංක | වර්ෂය | වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති /නැති බව | වැටුප් වර්ධක දිනය |
|---|---|---|---|
| i. | 2026 | උපයාගෙන ඇත /නැත | |
| ii. | 2025 | උපයාගෙන ඇත /නැත | |
| iii. | 2024 | උපයාගෙන ඇත /නැත | |
| iv. | 2023 | උපයාගෙන ඇත /නැත | |
| v. | 2022 | උපයාගෙන ඇත /නැත | |
| vi. | 2021 | උපයාගෙන ඇත /නැත | |

(කරුණාකර වසර 06හි වැටුප් වර්ධක පත්‍රිකාවන්හි සහතික කළ පිටපත්(185 පොදු ආකෘති පත්‍රය) 2026 වර්ෂය ඇමුණුම 04 ලෙස සටහන් කර ඇමුණුම 09 දක්වා වර්ෂ අනුව පිළිවෙලින් අමුණන්න.)

3. වගු අංක 02හි දැක්වෙන පරිදි, අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හයක (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර **ඇති බවත්/ නැති බවත්**,*

3.1. වගු අංක 02

| අනු අංකය | වර්ෂය | අවසාන ඇගයුම | ප්‍රමාණකරු විසින් අත්සන් තබා ඇති/නැති බව |
|---|---|---|---|
| i. | 2025 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| ii. | 2024 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| iii. | 2023 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| iv. | 2022 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| v. | 2021 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |
| vi. | 2020 | විශිෂ්ඨයි / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි / සතුටුදායකයි / අසතුටුදායකයි | ඇත / නැත |

(කරුණාකර එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව වගු අංක 02 සම්පූර්ණ කර, **<u>2025 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාවේ සහතික කළ පිටපත පමණක්</u>** ඇමුණුම 10 ලෙස දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර අමුණන්න.)

4. වගු අංක 03හි දැක්වෙන පරිදි, නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව කිසිදු විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගෙන **ඇති / නොමැති** බවත්,* විනය කරුණු මත සතුටුදායක සේවා කාලය අඩුවී **ඇති / නොමැති** බවත්,*

4.1. වගු අංක 03

| **විනය නියෝගය** | **චෝදනා පත්‍රය අනුව වරද සිදු කළ කාල සීමාව** | **සතුටුදායක සේවා කාලය අඩුවන දින ගණන** | | |
|---|---|---|---|---|
| | | **අවු.** | **මාස** | **දින** |
| | | | | |
| | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | |

(කරුණාකර විනය තීරණ වල සහතික කරන ලද පිටපත් ඇමුණුම 11, 11(a), 11(b) …. ලෙස දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර අමුණන්න.)

**5. නිලධාරියාට / නිලධාරිනියට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදු වෙමින් පවතින / නොපවතින බවත්,***

6. වගු අංක 04හි දැක්වෙන පරිදි, නිලධාරියා/නිලධාරිනිය වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබාගෙන **ඇති / නොමැති** බවත්,* වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවී **ඇති / නොමැති** බවත්,*

6.1. වගු අංක 04

| **අනු අංකය** | **නිවාඩු අනුමැතිය සඳහා අදාළ විධිවිධාන** | **කාල සීමාව** | | **සේවා කාලය අඩුවන දින ගණන** | | |
|---|---|---|---|---|---|---|
| | | **සිට** | **දක්වා** | **අවු.** | **මාස** | **දින** |
| i. | ආයතන සංග්‍රහයේ V:2.5.4 | | | | | |
| ii. | ආයතන සංග්‍රහයේ XII:16 | | | | | |
| iii. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| iv. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| v. | ආයතන සංග්‍රහයේ XII: 36 | | | | | |
| vi. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | | | | |
| vii. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 අනුව වැටුප් රහිත දේශීය/විදේශීය නිවාඩු | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

(කරුණාකර නිවාඩු අනුමත කළ ලිපි වල සහතික කළ පිටපත් ඇමුණුම 12, 12(a), 12(b) …. ලෙස දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර අමුණන්න)
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 (i) හි (උ) වගන්තිය ප්‍රකාරව අදාළ වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ දායක මුදල ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් හා, එහි (ච) වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් වන ලේඛන වල සහතික කළ පිටපත් ඇමුණුම 13, 13(a), 13(b) …. ලෙස දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර අමුණන්න. ඉහත vii. පරිදි නිවාඩු ලබා ඇත්නම් පමණි)

6.2. නිලධාරියා / නිලධාරිනිය ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 14 වගන්තිය අනුව විදේශ අධ්‍යයන නිවාඩු ............................................ දින සිට ...................................... දින දක්වා (කාල සීමාව) **ලබා ගෙන ඇති / ලබා ගෙන නොමැති** බවත්,*

6.3. වගු අංක 03 හි සහ වගු අංක 04 හි දැක්වෙන සේවා කාලය අඩුවන දිනයන්හි මුළු එකතුව

අවු. ......................... මාස ................ දින ................. බවත්,

6.4. නිලධාරියා / නිලධාරිනිය I ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලබන දිනය (6.3හි සඳහන් කාල සීමාවන් ද අනුව)

| Y | Y | Y | Y | M | M | D | D |
|---|---|---|---|---|---|---|---|

බවත්,

7. මෙම නිලධාරියා/නිලධාරිනියගේ වැඩ, පැමිණීම හා හැසිරීම **සතුටුදායක බවත් / සතුටුදායක නොවන බවත්,***

8. ........................................................................................ මහතා / මහත්මිය / මෙනවිය ................................ දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බවට, **නිර්දේශ කරමින් / නිර්දේශ නොකරමින්,***

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත ද, අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමග එවමි.

............................................ ................................................

දිනය | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව :

*අදාළ නොවන වචන කපා හරින්න

**<u>(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.</u>**

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ ................................................................................ මහතා / මහත්මිය / මෙනවිය ගේ රාජකාරී හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමග එකඟ වෙමි / එකඟ නොවෙමි.*

2. නිලධාරියාගේ / නිලධාරිනියගේ රාජකාරී, හැසිරීම, විශේෂ කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක් කළෙමි. ........................................................................................ මහතා / මහත්මිය / මෙනවිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම **නිර්දේශ කරමි / නොකරමි**.*

   නිර්දේශ නොකරන්නේ නම් එයට හේතුව,

   ........................................................................................................................................
   ........................................................................................................................................
   ........................................................................................................................................

3. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත ද, අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමග එවමි.

............................................ ................................................

දිනය | අමාත්‍යාංශ ලේකම්ගේ / පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන

*අදාළ නොවන වචන කපා හරින්න.

නිල මුද්‍රාව :

**සැ.යු. : අමාත්‍යාංශ ලේකම් / පළාත් ප්‍රධාන ලේකම් හැර වෙනත් බලය පැවරූ නිලධාරියෙකු අයදුම්පත්‍රය නිර්දේශ කරන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව / පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් යොමු කළ යුතු වේ.**